# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2302/07 – 2022 ඔක්තෝබර් 17 වැනි සඳුදා – 2022.10.17**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2020/215.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. එක්සත් වෙළෙඳ සේවා සංගමය, අංක 457, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, කොළඹ 02.
2. ජාතික සේවක සංගමය, 416, කෝට්ටේ, පිටකෝට්ටේ.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

සිලෝන් ලෙදර් ප්‍රොඩක්ට්ස් මැනුෆැක්චර්ස් ලිමිටඩ්, අංක. 64, බැලුම්මහර, මුදුන්ගොඩ.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, කොස්වත්ත, රිචඩ් ද සොයිසා නිවාස සංකීර්ණය, අංක 4, නීතිඥ පියල් දර්ශන ගුරුගේ මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

1A – G 37807 – 09 (2022/10)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/03/2020/215.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. එක්සත් වෙළෙඳ සේවා සංගමය, අංක 457, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, කොළඹ 02.
2. ජාතික සේවක සංගමය, 416, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සිලෝන් ලෙදර් ප්‍රොඩක්ට්ස් මැනුෆැක්චර්ස් ලිමිටඩ්, අංක. 64, බැලුම්මහර, මුදුන්ගොඩ.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

''සිලෝන් ලෙදර් ප්‍රොඩක්ට්ස් මැනුෆැක්චර්ස් ලිමිටඩ් ආයතනයේ සේවකයින් සඳහා 2018 වර්ෂය සඳහා 20% ක් ද, 2019 වර්ෂය සඳහා 15% ක් ද, 2020 වර්ෂය සඳහා 15% ක් ද වශයෙන් වැටුප් වැඩිකර හිඟ වැටුප් සමග ගෙවන ලෙස වෘත්තීය සමිතිය විසින් කරන ඉල්ලීම යුක්ති සහගත වන්නේ ද එසේ යුක්ති සහගත වන්නේ නම් කුමන ප්‍රතිශතයකින් කුමන සහනයන් කවදා සිට හිමිවිය යුතු ද යන්න පිළිබඳව වේ.''.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 26 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 10 – 0155

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.